ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියා - ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගීතාවය - නව අවස්ථාවන් හඳුනාගනිමින්, නව බැඳීම් නිර්මාණය කරමින්</u>

මහ කොමසාරිස් කාර්යාලය විසින් “නව අවස්ථාවන් හඳුනාගනිමින්, නව බැඳීම් නිර්මාණය කරමින්” යන තේමාව යටතේ ඉන්දියාවේ නිෂ්පාදිත ආරක්ෂක උපකරණ ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂක නිෂ්පාදන ක්ෂේත්‍රයේ සහයෝගීතාවය වර්ධනය කළ හැකි ආකාර සොයා බැලීමට සංවිධානය කළ ආරක්ෂක සහයෝගීතා සමුළුවක් 2024 අප්‍රේල් 10 වන දින කොළඹ, ටාජ් සමුද්‍ර හෝටලයේ දී පැවැත්විණ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දීය රජයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ආරක්ෂක නිෂ්පාදන) ශ්‍රී අනුරාග් බජ්පායි මහතා ප්‍රමුඛ ඉන්දියානු නියෝජිත පිරිස සමඟ සමුළුවට සහභාගී විය. හින්දුස්ථාන් ඒරෝනොටික්ස් ලිමිඩට්, භාරත් ඉලෙක්ට්‍රොනික්ස් ලිමිටඩ්, සෙන් ටෙක්නොලජීස්, SSS ඩිෆෙන්ස්, භාරත් ෆෝජ්, බිග් බෑන්ග් බූම් සොලියුෂන්ස්, AWEL , AVNL , මහින්ද්‍රා ඩිෆෙන්ස්, සාගර් ඩිෆෙන්ස් සහ ටාටා ඇඩ්වාන්සස් සිස්ටම් ලිමිටඩ් ඇතුළු ඉන්දියාවේ ආරක්ෂක සමාගම්වල නියෝජිතයන්ගෙන්

ඉන්දීය නියෝජිත පිරිස සමන්විත විය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිතුමා, ශ්‍රී ලංකා නාවික හමුදපතිතුමා, ශ්‍රී ලංකා ගුවන් හමුදපතිතුමා සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදවන්ගේ, පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සමාගම්වල නියෝජිතයන් රැසක් ද සමුළුව සඳහා සහභාගී වූහ.

2. මහ කොමසාරිස් ජා මහතා ආරක්ෂක ක්ෂේත්‍රය ඇතුළු විවිධ අංශ වල පවතින ඉන්දියා - ශ්‍රී ලංකා ද්විපාර්ශවික සහයෝගීතාවයේ ඉහළ යන විවිධාංගීකරණය අවධාරණය කළේය. භූගෝලීය පිහිටීම හේතුවෙන් ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව එකිනෙක හා සම්බන්ධව එකිනෙක හා බැඳී පවතින බව එතුමා අවධාරණය කළේය. ඉන්දියාවේ ආරක්ෂක අපනයන මේ වන විට ඇමරිකානු ඩොලර් බිලියන 2.6ක් ලෙස වාර්තා වන අතර එය පසුගිය වර්ෂ පහ ඇතුළත දස ගුණයක වර්ධනයකි. මෙම සමුළුව ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ වර්ධනය වන හැකියාවන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක ක්ෂේත්‍රය වෙත ලබාදිය හැකි ආකාර ගවේෂණය කරන තවත් වේදිකාවක් වන බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය.

3. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා ඉන්දීය ආරක්ෂක කර්මාන්තයේ වර්ධනය පැසසුමට භාජනය කළ අතර සමුළුව ස්ථාවර ඉන්දීය සාගර කලාපයක් සඳහා දයකත්වය ලබාදෙමින් දෙරට අතර සහයෝගීතාවයට පහසුකම් සලසනු

ඇති බව සඳහන් කළේය. පසුගිය දශකය තුළ අඩු පිරිවැය සහ විශේෂයෙන් සැකසූ නිෂ්පාදන ඉන්දියාවෙන් ලබා ගැනීම ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරගැනීමට සහය වූ බව අමාත්‍යතුමා ප්‍රකාශ කළේය. ඉන්දීය ආරක්ෂක කර්මාන්ත සමඟ සහයෝගීතාවය සහ ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනයට ද හේතු වනු ඇති බව එතුමා සඳහන් කළේය. අර්බුද සමයන් හි ශ්‍රී ලංකාව සමඟ රැඳී සිටීම වෙනුවෙන් අමාත්‍යතුමා ඉන්දීය රජයට ස්තුතිය ද පළ කළේය.

4. මෙම අවස්ථාව අමතමින්, අතිරේක ලේකම් (ආරක්ෂක නිෂ්පාදන) ශ්‍රී අනුරාග් බජ්පායි මහතා ශ්‍රී ලංකාව ඉන්දියාවේ ප්‍රමුඛ සහකරුවෙකු බව ප්‍රකාශ කළ අතර ඉන්දියාව අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR) යන දැක්මෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා සහ හැකියා ගොඩනැගීම සහතික කිරීම සඳහා කැපවී කටයුතු කරන බවට සහතික විය. ඉන්දියානු සාගර කලාපය තුළ මුහුණ දෙන පොදු ආරක්ෂක අභියෝග ඉස්මතු කළ එතුමා වඩා සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සහයෝගය ඉහළ නැංවිය යුතු බව ප්‍රකාශ කළේය. නව්‍යකරණය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරමින් වේගවත් පර්යේෂණ සහ සංවර්ධන සහ දේශීය නිෂ්පාදන පරිසර පද්ධතීන් ස්ථාපිත කිරීමෙහි ලා ආත්ම නිර්භාර් භාරත් හෙවත් ස්වයං පෝෂිත

ඉන්දියාවක ශක්තිමත් ගමන්මඟ එතුමා පැමිණ සිටි පිරිස සම ඟ බෙදා හදා ගත්තේය.

5. මෙවැනි ආරක්ෂක සමුළුවක් සහ ප්‍රදර්ශනයක් 2023 ජූනි 07 වන දින ද ශ්‍රී ලංකාවේ පැවැත්විණ. ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් L 70 තුවක්කු, ඉන්ද්‍රා රේඩාර්, ගැඹුරු මුහුද නිරීක්ෂණ යාත්‍රා, හමුදා පුහුණු සිමියුලේටර් වැනි පුළුල් පරාසයක ඉන්දීය ආරක්ෂක උපකාරණ සාර්ථකව මෙහෙයවයි. මෑත කාලයේදී ඉන්දීය රජය පාවෙන තටාකය, සමුද්‍රීය මුදවාගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ ඩෝනියර් ගුවන් යානා සැපයීමට ද එකඟ වී ඇති අතර මෙම පියවර ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ගේ ධාරිතා ගොඩනැගීමට ඉවහල් වනු ඇත. මෙම සමුළුව ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකාවේ ධාරිතාවයන් ගොඩනැගීම සඳහා ඉන්දියාවේ කැපවීම යළි තහවුරු කරන තවත් පියවරකි.

***

කොළඹ
2024 අප්‍රේල් 10